# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1855/19 - 2014 මාර්තු මස 25 වැනි අඟහරුවාදා - 2014.03.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමන් විසිනි**

මුද්‍රාව

මහින්ද රාජපක්ෂ.

1. මැක්ස්වෙල් පරාක්‍රම පරණගම මැතිතුමා
2. දිමින්ගු බඩතුරුගේ ප්‍රියන්ති සුරංජනා විද්‍යාරත්න මැතිතුමිය
3. මනෝ රාමනාදන් මැතිතුමිය

වෙත,

ශුභාශිංසන පෙරටුවයි

පරීක්ෂණ කොමිෂන් සභා පනතේ (393 වැනි අධිකාරය වූ) 2 වැනි වගන්තියේ විධිවිධානයන්ට අනුකූලව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මහින්ද රාජපක්ෂ වන මවිසින් වර්ෂ 2013ක් වූ අගෝස්තු මස 12 වැනි දිනැති අධිකාර පත්‍රය මගින්, ශ්‍රී ලංකාවේ උතුරු හා නැගෙනහිර පළාත්වල පදිංචිව සිටි යම් තැනැත්තන් සිය කැමැත්තෙන් තොරව පදිංචි ස්ථානවලින් ඉවත්කරගෙන යනු ලැබ හෝ අතුරුදහන්වී ඇත්ද යන වග පරීක්ෂා කිරීමේ කොමිෂන් සභාවට ඔබතුමන්ලා පත් කරනු ලැබ ඇති හෙයින් ද,

තවද, එසේ සිය කැමැත්තෙන් තොරව පදිංචි ස්ථානවලින් ඉවත්කරගෙන යනු ලැබ හෝ අතුරුදහන්වී ඇතැයි සළකනු ලබන කාල සීමාව 1983 ජනවාරි මස 01 වැනි දින සිට 2009 මැයි මස 19 වැනි දින දක්වා සංශෝධනය විය යුතු බවට හඳුනාගෙන ඇති හෙයින් ද,

තවද, ඉහත කී පරීක්ෂණ කොමිෂන් සභා පනතේ (393 වැනි අධිකාරය වූ) 4 වැනි වගන්තියේ විධිවිධානයන්ට අනුකූලව එකී පරීක්ෂණ කොමිෂන් සභාවේ අවසන් වාර්තාව ඉදිරිපත් කළ යුතු දිනය වර්ෂ 2014ක් වූ අගෝස්තු මස 15 වැනි දින වශයෙන් දීර්ඝ කර ඇති හෙයින් ද,

ඔබතුමන්ලාගේ විචක්ෂණභාවය, සාමර්ථ්‍යය හා පක්ෂපාතිත්වය ගැන මහත්වූ භක්තිය හා විශ්වාසය තබමින් පූර්වෝක්ත අධිකාර පත්‍රය මගින් පිහිටුවනු ලැබූ පරීක්ෂණ කොමිෂන් සභාවේ දක්වා ඇති කාර්යයන් ක්‍රියාවට නංවනු පිණිස අවශ්‍ය විය හැකි සියළුම පියවර ගන්නා මෙන් ඔබතුමන්ලාට මම මෙයින් නියම කරමි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුද්‍රාව යටතේ වර්ෂ දෙදහස් දහහතරක් වූ මාර්තු මස විසිඑක් වන දින වන මෙදින කොළඹ දී දෙන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ නියමය පරිදි,

ලලිත් වීරතුංග,
ජනාධිපති ලේකම්.


1A - G 19002— 70 (2014/03)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*